# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1776/5 – 2012 සැප්තැම්බර් 17 වැනි සඳුදා – 2012.09.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1995 ජූලි මස 25 වැනි දින අංක 881/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ* ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1995 අංක 67 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03ජේ/93/එල්බීආර්/26/11.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කැල/7/ඉඅ/3/183.
2012 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරී පත්තුව සුළු කොට්ඨාසයේ, ඔඩල්ගොඩ ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2813 හා 2006.04.21 දිනැති පිඹුරේ කැබලි අංක 26, 27 හා 28 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.04 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් තුනට මායිම්:

01. **කැබලි අංක 26, මුහන්දිරම්වල, කජුගහකුඹුර සහ දන්ගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.012**

උතුරට: ඩී. කේ. ගනේගොඩ සහ තවත් අය හිමිකම් කියන දිප්පිටිගොඩ 1 වන හරස් පාරේ, වරි. අංක 15/35 දරන ඉඩම සහ වරි. අංකය නොදන්නා ඉඩම සහ එස්. ගනේගොඩ හිමිකම් කියන දිප්පිටිගොඩ 1 වන හරස් පාරේ වරි.අංක නොදන්නා ඉඩම; නැගෙනහිරට: එස්. ගනේගොඩ හිමිකම් කියන දිප්පිටිගොඩ, 1 වන හරස් පාරේ වරි. අංක නොදන්නා ඉඩම, කැබලි අංක 27 සහ 28; දකුණට: කැබලි අංක 28, 29 සහ හිඹුටුවැල්ගොඩ ගම් මායිම්; බටහිරට: හිඹුටුවැල්ගොඩ ගම්මායිම්, ඩී. කේ. ගනේගොඩ සහ තවත් අය හිමිකම් කියන පාරේ, වරි. අංක 15/35 දරන ඉඩම සහ වරි. අංක නොදන්නා ඉඩම.

02. **කැබලි අංක 27, මුහන්දිරම්වල, කජුගහකුඹුර සහ දන්ගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.001**

උතුරට: කැබලි අංක 26 සහ එස්. ගනේගොඩ හිමිකම් කියන දිප්පිටිගොඩ 1 වන හරස් පාරේ, වරි.අංක නොදන්නා ඉඩම;නැගෙනහිරට: එස්. ගනේගොඩ හිමිකම් කියන දිප්පිටිගොඩ, 1 වන හරස් පාරේ වරි. අංක නොදන්නා ඉඩම සහ කැබලි අංක 28; දකුණට: කැබලි අංක 28 සහ 26; බටහිරට: කැබලි අංක 26.

03. **කැබලි අංක 28, මුහන්දිරම්වල, කජුගහකුඹුර සහ දන්ගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.027**

උතුරට: කැබලි අංක 27 සහ එස්. ගනේගොඩ හිමිකම් කියන දිප්පිටිගොඩ 1 වන හරස් පාරේ, වරි. අංකය නොදන්නා ඉඩම; නැගෙනහිරට: එස්. ගනේගොඩ හිමිකම් කියන දිප්පිටිගොඩ, 1 වන හරස් පාරේ වරි. අංක නොදන්නා ඉඩම සහ දුනු විර සහ දැදිගම හිමිකම් කියන දිප්පිටිගොඩ 1 වන හරස් පාරේ වරි.අංක 53 දරන ඉඩම සහ වරි. අංක නොදන්නා ඉඩම;

දකුණට: දුනුවීර සහ දැදිගම හිමිකම් කියන දිප්පිටිගොඩ 1 වන හරස් පාරේ වරි. අංක 53 දරන ඉඩම සහ වරි. අංක නොදන්නා ඉඩම සහ කැබලි අංක 29; බටහිරට: කැබලි අංක 29, 26 සහ 27.

10 - 92

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව සංශෝධනය කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1434/26 හා 2006.03.02 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ* ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද, 2006 අංක 77 හා 2006.02.22 වැනි දින දරන ආඥාවේ ඉඩම් කැබලි 65ක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ.

එනමුත් මේ කියන ලද ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නොමැති බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනතින් මට පැවරී ඇති බලතල ප්‍රකාරව මා විසින් අංක කො. 8854 දරන පිඹුරේ කැබලි අංක 45 ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සඳහා නිකුත් කරන ලද 2012.04.23 දිනැති අංක 1755/5 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නිවේදනය තො. 8854 පිඹුරේ කැබලි අංක 46 ලෙස සංශෝධනය විය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන් ,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2003/එන්එච්/596.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 1/7/1/119.
2012 සැප්තැම්බර් මස 06 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ගොවිජන මන්දිරය',
බත්තරමුල්ල.

10 - 93

ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 128 දරන ආඥාව**

මගේ අංකය: එල්ඩී/05/2009/ඩබ්එස්/272.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 4/3/1/9.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව අංක 1761/14 හා 2012.06.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ* ගැසට් පත්‍රයේ 3ඒ පිටුවේ පළ කරන ලද 2012 අංක 128 දරන ආඥාවේ ඉඩමේ විස්තරය යටතේ සඳහන් "කැබලි අක්ෂර බී - කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය ප්‍රමාණය හෙක්. 0.2026ක් පමණ" යන්න ඉවත්කොට ඒ වෙනුවට "කැබලි අක්ෂර බී - කොලේමෝදරඹිවිට සහ පිටකට්ටිය, ප්‍රමාණය හෙක්. 0.1353 ක් පමණ" යන්න ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 95

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.